# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 7 දරන මුදල් නීති (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 24 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 මාර්තු මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි.　　තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1988 අංක 7 දරන මුදල් නීති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 10/87

## මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1988 අංක 7 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මුදල් නීති පනතේ 10 වන වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 422 වන අධිකාරයේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආආ) 117 වන වගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ උකසක් හෝ අන්‍යාකාර ඇපයක් මත මහ බැංකුවේ නිලධරයන්ට සහ සේවකයන්ට නිවාස ඉදිකිරීමේ කාර්යය සඳහා ණය සහ අත්තිකාරම් ප්‍රදානය කළ හැකිය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

"වැටුප හෝ පාරිශ්‍රමිකය පොදු අරමුදලින් ගෙවනු ලබන යම් ධුරයක හෝ තත්ත්වයක සේවය කිරීමට තාවකාලිකව මුදා හරින ලද හෝ රාජ්‍ය සංස්ථාවක් වන යම් බැංකු ආයතනයක අධ්‍යක්ෂවරයකු වන ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකු හෝ සේවකයකු නියෝජ්‍ය අධිපතිවරයකු වශයෙන් පත් කිරීමෙහි ලා (ආ) හෝ (ඇ) ඡේදවල අඩංගු කිසිවකින් හෝ නුසුදුස්සකු නොකරන ලෙස සැලකිය යුතු ය.";

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) මණ්ඩලයේ මතය අනුව තම කාර්ය ක්‍රියාත්මක කිරීමෙහි ලා ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් :

එසේ වුවද වැටුප හෝ වෙනත් පාරිශ්‍රමිකය පොදු අරමුදලින් ගෙවනු ලබන යම් ධුරයක හෝ තත්ත්වයක සේවය කිරීමට හෝ රාජ්‍ය සංස්ථාවක් වන බැංකු ආයතනයක, ඒ බැංකු ආයතනයේ අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කිරීමට හෝ (3) වන උපවගන්තිය යටතේ තාවකාලිකව මුදා හරිනු ලැබූ යම්

නියෝජ්‍ය අධිපතිවරයකු, ඔහු ඒ ධුරය හෝ තත්ත්වය දරන නිසාම හෝ ඒ අධ්‍යක්ෂවරයා වන නිසාම අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ඔහු ධුරයෙන් ඉවත් කිරීමට මේ උපවගන්තියේ කිසිවකින් මුදල් මණ්ඩලයට බලය පැවරෙන්නේ යයි තීරණය නොකළ යුතුය." ;

(ඇ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (3) මුදල් මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මුදල් මණ්ඩලය විසින් සමාන එකඟත්වය ඇතිව තීරණය කරනු ලබන යම් නියමයන් මත—

(අ) වැටුප හෝ වෙනත් පාරිශ්‍රමිකය පොදු අරමුදලින් ගෙවිය යුතු යම් ධුරයක හෝ තත්ත්වයක සේවය කිරීමට ;

(ආ) රාජ්‍ය සංස්ථාවක් වන බැංකු ආයතනයක ඒ බැංකු ආයතනයේ අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කිරීමට ;

නියෝජ්‍ය අධිපතිවරයකු තාවකාලිකව මුදා හරිනු ලැබිය හැකි ය.

මේ වගන්තියේ කාර්යය සඳහා " රාජ්‍ය සංස්ථාව " යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාවෙහි දී ඇති අර්ථයම ඇත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 120 අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 120 අ වගන්තිය වශයෙන් බල සහිත විය යුතු ය :—

" මහබැංකුවේ නිලධරයන් සහ සේවකයන් මුදා හැරීම.

120අ. 23 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, මුදල් මණ්ඩලය විසින්, මහ බැංකුවේ යම් නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව මහ බැංකුවෙන් පිටත යම් නිලයක හෝ ධුරයක සේවය කිරීමට මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් නියමයන් සහ කොන්දේසි මත ආණ්ඩුවේ ඉල්ලීම පිට හෝ නොඑසේව තාවකාලිකව මුදා හරිනු ලැබිය හැකි ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.